**ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2021**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ (සමාගම්වලට අදාළ නැත) විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 99 වැනි ඡේදය අනුව, සියලුම ආදායම්, අතිරික්තය හෝ ඌනතාවය ගණනය කිරීමේදී ඇතුළත් කළ යුතු නමුත්, සමාලෝචිත වර්ෂය තුළ උපයාගත් රු.24,700,208ක කෙටිකාලීන ආයෝජනයෙන් ලැබුණු පොලී ආදායම, ආදායම් ලෙස හඳුනා නොගෙන විශේෂිත අරමුදල් වලට බැර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා වන ඌනතාවය සහ විශේෂිත අරමුදල් මූල්‍ය ප්‍රකාශනවල එම සමාන ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | එය විශේෂිත අරමුණු සඳහා වෙන් කර ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනයේ ආදායමක් ලෙස හඳුනාගෙන නොමැති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 50 වැනි ඡේදය අනුව ආයතනයක මෙහෙයුම්වල සමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති වත්කම් කාණ්ඩගත කිරීමකින් තොරව, පිරිවැය රු.105,634,056ක්වූ අනෙකුත් වත්කම් දේපල, පිරියත සහ උපකරණ යටතේ දක්වා තිබුණි. | 2022 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, වත්කම් නිවැරදි වත්කම් කාණ්ඩ යටතේ කාණ්ඩගත කරන බව. | -එම- |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 වැනි ඡේදය අනුව ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. පිරිවැය රු.609,026,512ක් වූ දේපළ, පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තවමත් භාවිතා කරමින් පැවතුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 3ට අනුකූලව ඉහත ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රමිතියට අනුව වත්කම් නැවත තක්සේරු කිරීමට කටයුතු කරනු ලැබේ. | -එම- |

| | | |
|---|---|---|
| (ඇ) 1986 සිට 2017 දක්වා කාලය තුළ භාණ්ඩාගාරයෙන් ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානයන් ක්‍රමක්ෂය කර නොතිබුණි. තවද, 2018 සිට 2021 දක්වා කාලය තුළ ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.1,087,500,000ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 11 අනුව ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පාලන අධිකාරියේ අනුමැතිය ඇතිව ප්‍රදානයන් ක්‍රමක්ෂය කරන බව. | -එම- |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රීඩා භාණ්ඩ සඳහා ක්ෂයවීම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මධ්‍යස්ථානයේ සහ ත්‍රිකුණාමලය මණ්ඩපයේ ක්‍රීඩා භාණ්ඩ පිළිවෙලින් සියයට 10කින් සහ සියයට 20කින් ක්ෂය කර තිබුණි. එබැවින්, රු.16,159,548 ක් වූ ක්‍රීඩා භාණ්ඩවල සමුච්චිත ක්ෂයවීම්වල නිරවද්‍යතාවය සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | ක්‍රීඩා අයිතම සඳහා සියයට 25ක ක්ෂයවීම් අනුපාතයක් 2022 අවසන් ගිණුමට යොදන බව. | ක්‍රීඩා භාණ්ඩ සඳහා එක් ක්ෂය අනුපාතයක් භාවිතා කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලයේ ස්ථාන 15 ක හෙක්ටයාර 241.2 ක පමණ ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | එම ඉඩම්වල අයිතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව . | ඉඩම්වල වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | 2019 සිට 2021 දක්වා කාලය තුළ උසස් අධ්‍යාපන ව්‍යාප්ති හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය මඟින් රු.23,055,912 ක් වටිනා ජංගම නොවන වත්කම් අයිතම 275 ක් විශ්වවිද්‍යාලයට භාර දී තිබුණද, ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති උපදෙස් පරිදි එම වත්කම්වල වටිනාකම් ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි. | ක්ෂය කිරීම සඳහා අදාළ පෙර වර්ෂ ගැලපීම් සහිතව මෙම වත්කම්වල වටිනාකම 2022 වර්ෂයේ ගිණුම්වල දක්වන බව. | වත්කම් වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | 2008 වසරේ රු.3,666,316 ක වියදමින් ඉදිකරන ලද ව්‍යාධි විද්‍යාගාරය 2021 දෙසැම්බර් 31 වන විට රු.2,566,312 ක් වෙනුවට රු.280,116 කින් ක්ෂය කර තිබුණි. මේ හේතුවෙන් සමුච්චිත ක්ෂය අගය මූල්‍ය ප්‍රකාශනවල රු.2,286,196 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම්වල එය නිවැරදි කරන බව. | සමුච්චිත ක්ෂයවීම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ඈ) | දැනට විශ්වවිද්‍යාලයේ සේවය කරන කථිකාචාර්යවරුන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.34,042,950 ක් වූ බැඳුම්කර උල්ලංඝනය කිරීම් ලැබිය යුතු ලෙස ගිණුම් වල දක්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවල එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් සහ බැඳුම්කර බැඳීම් සංචිතය අඩුවෙන් දක්වා තිබුණි. | සුදුසු ගිණුම්කරණ ක්‍රමවේදයක් යෙදීමට පියවර ගන්නා බව. | බැඳුම්කර උල්ලංඝනය කිරීම් වල වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය සඳහා තෙමහල් ගොඩනැගිලි සංකීර්ණය රු.224,269,514 ක වියදමින් නිම කර 2020 අගෝස්තු 27 දින භාර දී තිබුණද එය ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂයවීම් සහ සමාලෝචිත වර්ෂය සඳහා වන ඌනතාවය පිළිවෙලින් රු.14,913,923 සහ රු.11,213,476 කින් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කිරීමට පියවර ගන්නා බව. | වත්කම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

1.5.4 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ගිණුමකට එකතුව රු.3,925,059ක්වූ ඍජු හර කිරීම් වසර 12ක සිට හඳුනා නොගෙන බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් හර ලෙස පෙන්වා තිබුණි. තවද, බැංකු ගිණුම් 02ක, එකතුව රු.1,604,146ක් වූ තැන්පතු වසර 11කට වැඩි කාලයක් බැංකු ප්‍රකාශනයේ උපලබ්ධි නොවූ තැන්පතු ලෙස පෙන්වා තිබුණු අතර, එම උපලබ්ධි නොවීම සඳහා හේතු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගණන්දීමේ නිලධාරියාගේ සීමාවන් තුළ ඉතිරි මුදල් කපා හැරීමට අනුමැතිය ලබා ගන්නා බව. | එම ශේෂයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

1.6 **ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

1.6.1 **ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (a) | 2021 දෙසැම්බර් 31 දිනට, රු.423,554,640ක මුළු ලැබිය යුතු ශේෂවලින් සියයට 58 ක් හෙවත් රු.245,496,675 ක් වසර 03 සිට 39 දක්වා අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | පවතින නීතිරීති සහ රෙගුලාසිවලට අනුව පවතින තොරතුරු මත පදනම්ව නොපියවූ අත්තිකාරම් ආපසු අයකර ගැනීමට/කපා හැරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරමින් සිටින බව. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (b) | ඉහත මුළු ලැබිය යුතු මුදල්වලින් ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 70 දෙනකුගෙන් අයකර ගැනීමට තිබූ රු.151,365,855ක | බැඳුම්කර අයකිරීම් සහ සමාලෝචන කමිටුව බැඳුම්කර පැහැර හරින අයගෙන් ඔවුන්ගේ පවතින විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් | කථිකාචාර්යවරුන් ගෙන් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු |

| | | |
|---|---|---|
| බැඳුම්කර වටිනාකම වසර 10 සිට 39 දක්වා අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ශේෂවලින් බැඳුම්කර අගය අයකර ගැනීම සඳහා කැමැත්ත ලබා ගැනීමට උපදෙස් දුන් බව. | කළ යුතුය. |

1.6.2 **ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.112,665,300 ක්වූ ගෙවිය යුතු මුළු ශේෂයෙන්, රු.15,996,706 ක ශේෂයක් 2021 දෙසැම්බර් 31 වන දිනට වසර 03 කට වැඩි කාලයක් නිරවුල් කිරීමකින් තොරව තිබූ අතර එය මුළු ගෙවිය යුතු මුදලින් සියයට 14 ක් නියෝජනය කරනු ලබයි. | ඉදිරියේදී අදාළ අධිකාරීන්ට ගෙවීමට පියවර ගන්නා බව. | ගෙවිය යුතු මුදල් පියවීමට කටයුතු කළ යුතුය. |

1.7 **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>මු.රෙ. 571 | වසර 03 සිට 06 දක්වා කාලයක් පැවති රු.9,091,397 ක රඳවා ගැනීමේ මුදල් 19 සම්බන්ධයෙන් පියවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | දෝෂ සහිත වගකීම් කාලයෙන් පසුව රඳවා ගැනීමේ මුදල් ගෙවන බව. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| (ආ) **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල ආයතන සංග්‍රහය** | | | |
| (i) III පරිච්ඡේදයේ 20.8 උප වගන්තිය සහ VI පරිච්ඡේදයේ 4.1 උප වගන්තිය | උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකුගේ ඉල්ලා අස්වීම සභාව විසින් 2020 අගෝස්තු 29 දින පිළිගෙන තිබුණි. පසුව, 2020 සැප්තැම්බර් 02 දින සිට බලපැවැත්වෙන පරිදි කථිකාචාර්යවරයා පෙර තනතුරට නැවත සේවයේ යොදවා ඇත. කෙසේ වෙතත්, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව, මූලික වැටුප වන රු.91,310 වෙනුවට රු.119,520 ලෙස වැටුප් පියවර තබා තිබූ අතර 2020 සැප්තැම්බර් 03 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ | XVII පරිච්ඡේදයේ 2.2 සහ 2.3 වගන්තිය සහ III පරිච්ඡේදයේ 20 වගන්තිය අනුව කවුන්සිලය විසින් එහි 307 වැනි රැස්වීමේදී අධිකාරිය ලබා දුන් බව. | ආයතන සංග්‍රහය අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.1,375,407 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| (ii) | III පරිච්ඡේදයේ 26.7.2 උපවගන්තිය | වෙනත් උසස් අධ්‍යාපන ආයතනවලින් හෝ වෙනත් පිළිගත් ආයතනවලින් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී පුරප්පාඩු පුවත්පත් මගින් ප්‍රචාරය කළ යුතු වුවද, උප වගන්තියට පටහැනිව බාහිර කථිකාචාර්යවරයා බඳවාගෙන තිබුණේ අදාළ පීඨයේ හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ හෝ පීඨාධිපතිවරුන්ගේ කැමැත්ත පරිදි විය. | ව්‍යවහාරික විද්‍යා පීඨය වර්තමානයේ බාහිර කථිකාචාර්ය පත්වීම් සඳහා පවතින කාර්ය සංග්‍රහය භාවිතා කිරීමට පටන් ගෙන ඇති බව. | ආයතන සංග්‍රහය අනුගමනය කළ යුතුය. |
| (iii) | XX පරිච්ඡේදයේ 3.1 උප වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන චක්‍රලේඛ ලිපිය | සියලුම කාර්ය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රය හරහා පැමිණීම සනාථ කළ යුතු වුවද අධ්‍යයන කාර්ය මණ්ඩලය එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්ප්‍රදායක් ලෙස ඇඟිලි ස්කෑනරයේ පැමිණීම සටහන් නොකරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (iv) | XXVI පරිච්ඡේදයේ 2.6 උප වගන්තිය සහ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 22 දිනැති චක්‍රලේඛ අංක 2004/LD/1 හි 03 වැනි ඡේදය. | රු.128,861,691 ක් වටිනා පුස්තකාල පොත් සහ වාර සටහන් පිළිබඳ තොග සත්‍යාපනය ආරම්භයේ සිට සිදු කර නොතිබුණි. | තොග සත්‍යාපනය සිදු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (v) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2013 හා 2013 අප්‍රේල් 10 දිනැති ආයතනික චක්‍රලේඛ ලිපිය මගින් සංශෝධිත XXVI පරිච්ඡේදයේ 3 වගන්තිය. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා එහි වාර්තාව 2022 මාර්තු 17 හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ලබා දිය යුතුව තිබුණද, එම වාර්තාව 2022 ජූලි 18 වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2020 වර්ෂය සඳහා වන සමීක්ෂණ වාර්තාවේ ක්‍රියාමාර්ගය සහ එහි පරිදි භාවිත කළ නොහැකි දේ ඉවත් කිරීම 2022 ජූලි 18 වන දින දක්වාම අවසන් කර නොතිබුණි. | මෙම ප්‍රමාදය Covid-19 වසංගතය හේතුවෙන් සිදුවී ඇති බැවින් එය සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 2014 ඔක්තෝබර් 21 දිනැති විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ නියෝගය සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාගේ 2014 දෙසැම්බර් 09 දිනැති අංක | විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ නියෝගය සහ අධිකරණය විසින් යෝජනා කරන ලද මතය අනුව 2015 ජුනි 24 දින සිට බලපැවැත්වෙන පරිදි උසස්වීම ලබාදිය යුතුව තිබුණද, කථිකාචාර්යවරයකු 2011 ජූලි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියේ | තේරීම් කමිටුව 2015 දෙසැම්බර් 21 දින රැස්වී 2011 ජූලි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II | විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ නියෝගය අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| CA/201/2014/EUSL ලිපියේ 4 වැනි ඡේදය. | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය නිලයට උසස් කර තිබුණි. මේ හේතුවෙන් 2011 සිට 2021 දක්වා කාලය තුළ කථිකාචාර්යවරයාට රු.3,208,006 ක පුද්ගලික දීමනා වැඩිපුර ගෙවා තිබුණි. | ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කර තිබුණු බව. |

2. **මූල්‍ය සමාලෝචනය**

-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 244,038,580 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 291,444,058 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,405,478 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව අනෙකුත් ක්‍රියාකාරකම් මත ශුද්ධ ආදායමේ සියයට 172 ක සහ වැඩිවීම සහ පසුගිය වර්ෂයට සාපේක්ෂව ක්ෂය සහ ක්‍රමක්ෂය වියදමේ සහ අනෙකුත් මෙහෙයුම් වියදම් වල පිළිවෙලින් සියයට 26 ක සහ සියයට 19 ක අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** **ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

-------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පෞද්ගලික වැටුප් වැනි වියදම් පෙර වසරට සාපේක්ෂව රු.43,828,684 කින් හෙවත් සියයට 3කින් ඉහළ ගොස් තිබුණි

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෑම දිනකම අවසානයේ REPO තැන්පතුවේ මුදල් තැන්පත් කර අමතර ආදායමක් උපයා ගැනීම අනෙකුත් විශ්වවිද්‍යාලවල සාමාන්‍ය සිරිත වුවද ත්‍රිකුණාමල විශ්වවිද්‍යාලයේ වගකිවයුතු නිලධාරීන් එසේ කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ සෑම දිනක් අවසානයේම ජංගම ගිණුමේ රුපියල් මිලියන 50 සිට රුපියල් මිලියන 156 දක්වා මුදලක් ඇති බව නිරීක්ෂණය විය. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට සභාවෙන් අනුමැතිය ලබාගෙන ඇති බවත් ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව. | තැන්පතුවලින් අමතර ආදායමක් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2013 සිට 2015 දක්වා කාලය තුළ පුද්ගලික සමාගමට ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම සඳහා රුපියල් 6,247,846 ක මුදලක් ගෙවා තිබුණද, එය ක්‍රමානුකූලව යාවත්කාලීන කර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට සමහර ගනුදෙනු ඇතුළත් කර නොතිබුණි. තවද, ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති ගැටළු යාවත්කාලීන කිරීමට සහ නිවැරදි කිරීමට කටයුතු කර නොතිබූ අතර පවතින භෞතික වත්කම්වල වටිනාකම, මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම්වල වටිනාකම සහ ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම්වල වටිනාකම අතර සැලකිය යුතු විෂමතාවයක් නිරීක්ෂණය වී තිබුණි. එබැවින් එවැනි ලේඛනයක් සකස් කිරීම සඳහා දරන ලද වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි. | මේ වන විට දෙපාර්තමේන්තු තුනක සත්‍යාපනය අවසන් කර ඇති අතර මූල්‍ය ශාඛාවේ සත්‍යාපනය සිදු වෙමින් පවතින බව. | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 වසරේ සිට විශ්වවිද්‍යාල ඉඩම් 15ක අයිතිය ලබා ගැනීම සඳහා උපදේශන ගාස්තු ලෙස රු.1,215,000ක් ගෙවා තිබුණද, එම ඉඩම්වල අයිතිය 2022 ජූලි 25 වැනිදා දක්වා පැවරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | එම ඉඩම්වල අයිතිය ලබාගැනීමට මේ වන විටත් කටයුතු ආරම්භ කර ඇති බව. | ඉඩම්වල අයිතිය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

3.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ----------------------------- | -------------------- |
| (අ) | 2015 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම සහ අධ්‍යයන වගවීම අනුව, ප්‍රධානියා, ප්‍රධාන මහාචාර්ය, මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය, උපදේශක I ශ්‍රේණිය සහ උපදේශක II ශ්‍රේණිය විසින් වසරකට අවම ශිෂ්‍ය සම්බන්ධතා පැය ගණන පිළිවෙලින් පැය 180, 300, 360, 380, 450, 480 සහ 510 ලෙස පුද්ගලික කාලසටහනේ පිළිබිඹු කළ යුතුය. විගණනය සඳහා ලබා දී ඇති තොරතුරුවලට අනුව, 2021 වර්ෂය තුළ පීඨ 6ක අධ්‍යයන කාර්ය මණ්ඩලය 100ක් අතර ශිෂ්‍ය සම්බන්ධතා පැය 38,580ක් වෙන් කර තිබිය යුතු අතර, ඉහත සම්මත අගයන්ගෙන් සියයට 47ක් නියෝජනය වන පරිදි පැය 17,948ක් පමණක් වෙන් කර තිබුණි. තවද, ශිෂ්‍ය පර්යේෂණ හෝ කාර්මික ස්ථානගත කිරීම්, සායනික කටයුතු සහ අධ්‍යයන සම්බන්ධීකරණය අධීක්ෂණය සඳහා වැඩ සම්මත වෙන් කිරීම සනාථ කිරීම සඳහා කිසිදු වාර්තාවක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ බැවින්,සමස්ත ශිෂ්‍ය සම්බන්ධතා වේලාවන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ වැඩ ප්‍රමාණය පිළිබිඹු කිරීම සඳහා විශ්ව විද්‍යාලය වැඩ සම්මතයන් මත පදනම්ව මාර්ගෝපදේශයක් සකස් කර ඇති බව තහවුරු කර ගත නොහැකි විය. | වැඩ සම්මතයන් ගණනය කිරීමේදී, කාර්ය මණ්ඩලයේ වැඩ ප්‍රමාණය සහ පර්යේෂණ සඳහා සහභාගී වීම සහ අධීක්ෂණය සඳහා වැය කරන ලද ශිෂ්‍ය සම්බන්ධතා වේලාවන් සමඟ සැසඳිය යුතු බව සහ අදාළ සංකල්පිත වේලාවන්, සලකා බැලිය යුතුය. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ ශිෂ්‍ය සම්බන්ධතා වේලාවන් සහ සම්පූර්ණ වැඩ ප්‍රමාණය පිළිබිඹු කිරීම සඳහා වැඩ සම්මතයන් මත පදනම්ව මාර්ගෝපදේශයක් සකස් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ පවතින විෂයයන් සහ විෂය නිර්දේශයන් රටේ රැකියා වෙළෙඳපොළට සහ ජාතික ආර්ථිකයට ගැළපෙන පරිදි යාවත්කාලීන කළ යුතු අතර, දිනෙන් දින වෙනස් වන රැකියා වෙළෙඳපොළට අනුගත වන පරිදි තාක්ෂණික විෂයයන් සහ භාෂා කුසලතා විෂය මාලාවට ඇතුළත් කළ යුතුය. කෙසේ වෙතත්, කෘෂිකර්ම, තාක්ෂණ, ව්‍යවහාරික විද්‍යා වැනි පීඨ 03ක විෂය නිර්දේශය ආරම්භයේ සිටම සංශෝධනය කර නොමැති බව නිරීක්ෂණය විය. | කලා හා සංස්කෘතික පීඨය, විද්‍යා පීඨය සහ වාණිජ හා කළමනාකරණ පීඨය සිය විෂයමාලා සංශෝධනය කර ඇති අතර අනෙකුත් පීඨ විෂයමාලා සංශෝධනයට සූදානම්ව සිටින බව. | විෂයමාලා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපාර කළමනාකරණ උපාධිය සඳහා වන බාහිර උපාධි වැඩසටහනේ සිසුන්ගේ මාර්ගෝපදේශ පොතට අනුව, උපාධි වැඩසටහන සම්පූර්ණ කළ යුතු අවම කාලය අධ්‍යයන වර්ෂ 03 කි. කෙසේ වෙතත්, | Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාද වූ බව. | නියමිත කාලය තුළ උපාධි පාඨමාලාව අවසන් කිරීමට කටයුතු |

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා වන ව්‍යාපාර කළමනාකරණ උපාධි පාඨමාලාව වසර පහක් තිස්සේ සම්පූර්ණ කර නොතිබුණි. උපාධි පාඨමාලාව අවසන් කිරීම ප්‍රමාද වීමෙන් සිසුන්ගේ වෘත්තීය සහ රැකියා අවස්ථාවන්ට අහිතකර ලෙස බලපානු ඇත. | | කළ යුතුය. |
| (ඇ) | බාහිර උපාධි හා ව්‍යාප්ති පාඨමාලා මධ්‍යස්ථානය සහ කලා හා සංස්කෘතික පීඨය මගින් වසර 10ක් කට වැඩි කාලයක් කලා උපාධි පාඨමාලාව නැවත ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය වසර 10 තුළ මඩකලපුව දිස්ත්‍රික්කයේ උනන්දුවක් දක්වන සිසුන්ට දිස්ත්‍රික්කය තුල බාහිර ශාස්ත්‍රවේදී උපාධිය සම්පූර්ණ කිරීමේ අවස්ථාව අහිමි වී ඇති අතර එම සිසුන්ට වෙනත් දිස්ත්‍රික්කයක හෝ පළාතක පිහිටි විශ්ව විද්‍යාලවල උපාධි වැඩසටහන් අනුගමනය කිරීමට සිදු විය. තවද, විශ්වවිද්‍යාලය මගින් 2018 වසරේ සිට දර්ශනවේදී, උපාධි, ඩිප්ලෝමා සහ සහතිකපත් පාඨමාලා 11 ක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර උපාධි පාඨමාලාව සඳහා විෂයමාලා සංශෝධනය කිරීමට පීඨය කටයුතු කරමින් සිටින බවත් එය බාහිර උපාධි පාඨමාලාවට ද අදාළ වන බව. | ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | අවසාන් දිගුව අනුව 2020 මැයි මාසයේදී පර්යේෂණ අවසන් කිරීම සඳහා මහාචාර්යවරයෙකුට පර්යේෂණ ප්‍රදාන වශයෙන් 2015 වර්ෂයේදී රුපියල් 7,500,000 ක මුදලක් අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, එම ප්‍රතිපාදනවලින් රුපියල් 4,500,000ක් වියදම් කර තිබුණත් 2022 ජුනි 28 වන දින දක්වාත් පර්යේෂණ අවසන් කර නොතිබුණි. | සමාලෝචකයන්ගේ අදහස් ඇතුළත් අවසන් සම්පූර්ණ වාර්තාව බලාපොරොත්තුවෙන් සිටින බව. | පර්යේෂණ ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 **අරමුදල් නිෂ්කාර්ය හෝ ඌන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පර්යේෂණ කටයුතු සඳහා ලැබුණු රු.3,482,240 ක රජයේ ප්‍රදාන 2021 දෙසැම්බර් 31 දිනට වසර 03 සිට 05 දක්වා කාලයක් භාවිතයට නොගෙන තිබුණි. | රටේ තත්ත්වය හේතුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගෙන් කුඩා අයදුම්පත් ප්‍රමාණයක් ලැබී තිබුණු බව. | ප්‍රදාන අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) | කෘෂිකාර්මික පීඨය සහ විද්‍යා පීඨය සඳහා සමාලෝචිත වර්ෂයේදී උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතිය මගින් ලබා දුන් රු.23,046,063 ක් වටිනා පුද්ගලික පරිගණක 165 ක් , Compact wall mount speakers 24ක් සහ ශබ්ද මිශ්‍රණ යන්ත්‍ර 04 ලබා දී තිබුණු අතර වසරකට වැඩි කාලයක් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කර නොතිබූ අතර වසර 01 ක වගකීම් කාලයද අවසන් වී තිබුණි. | අභ්‍යන්තර කටයුතු අවසන් කිරීම සහ පරිගණක මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම සිදුවෙමින් පවතින බව. | භාණ්ඩ ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් සහ ප්‍රමාණවත් අරමුදල් නොමැතිව ත්‍රිකුණාමල පරිශ්‍රයේ අභ්‍යන්තර මාර්ගයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ පළමු අදියර 2017 මැයි 02 දින මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දී තිබූ අතර එහි කොන්ත්‍රාත් වටිනාකම රු.55,775,000 ක් විය. ගිවිසුමට අනුව 2017 නොවැම්බර් 01 දින කොන්ත්‍රාත්තුව අවසන් කළ යුතුව තිබූ නමුත් කොන්ත්‍රාත්තුව 2017 නොවැම්බර් මාසයේදී අත්හැර දමා තිබුණි. පසුව කොන්ත්‍රාත්තුව 2019 දෙසැම්බර් 03 දින නැවත ආරම්භ කර ඇති අතර 2022 මාර්තු 25 වන විට සමස්ත භෞතික ප්‍රගතිය වූයේ සියයට 45ක් පමණක් විය. | අරමුදල් හිඟකම සහ වසංගත තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් අත්හැර දමා ප්‍රමාද වීම සිදුවී ඇති බව. | කාල රාමුව තුළ ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ත්‍රිකුණාමලය මණ්ඩපය සඳහා බහුකාර්ය ශ්‍රවණාගාරය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව රු.674,467,920 ක මුදලකට ලබාදී තිබුණි. ගිවිසුමට අනුව, කොන්ත්‍රාත්තුව 2020 නොවැම්බර් 04 වන දින අවසන් කළ යුතු නමුත් 2022 මාර්තු 25 වන විට භෞතික ප්‍රගතිය සියයට 08 ක් පමණක් වූ අතර වසර එකහමාරක ප්‍රමාදයකින් පසු, පැවති මුල් කොන්ත්‍රාත් මුදල සඳහා ඉහළ උද්ධමනය සහ මිල ඉහළ යාම නරක ලෙස බලපානු ඇත. | 2021 මැද භාගය දක්වා රට තුළ පැවති Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ කටයුතුවල ප්‍රගතිය ප්‍රමාද වූ බව. | -එම- |

3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේදී, අදාළ අපේක්ෂකයා විසින් ඉදිරිපත් කරන ලද ජාතික ශූරතා සුදුසුකම් සහතිකය මත පදනම්ව, විශ්වවිද්‍යාලය විසින් එම අපේක්ෂකයා II/I ශ්‍රේණියේ ශාරීරික අධ්‍යාපන උපදේශක තනතුර සඳහා බඳවාගෙන තිබුණි. එහෙත් එම අපේක්ෂකයා එවැනි තරගයකට සහභාගි නොවූ බවත් එම සහතිකය ව්‍යාජ එකක් බවත් නැගෙනහිර පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව තහවුරු කර තිබුණි. | අදාළ අපේක්ෂකයා විසින් ඉදිරිපත් කරන ලද සහතිකය සත්‍යාපනය සඳහා ඉල්ලා ඇති බව. | සහතිකයේ වලංගුභාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වසර සඳහා වන ක්‍රියාකාරී සැලැස්මට අනුව පීය 06 ක් ක්‍රියාකාරකම් 680 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඉන් 329ක කටයුතු ආරම්භ කර නොතිබුණි. | පවතින වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර අවසන් කිරීමට නොහැකි වූ බවත් එය 2022 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ හැකි බව. | ඉලක්ක සපුරා ගැනීම සඳහා වන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ, රු.213,000,000 ක ප්‍රාග්ධන ප්‍රදානවලින් සියයට 41 ට සමාන රු.86,490,795 ක මුදලක් අපේක්ෂිත අරමුණු සඳහා වියදම් කර නොමැති අතර තවත් ප්‍රාග්ධන ප්‍රදාන රු.33,500,000 සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | පවතින වසංගත තත්ත්වය හේතුවෙන් ඇනවුම් කළ භාණ්ඩ ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් මෙය සිදුව ඇති බව. | ප්‍රතිපාදන ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |